උත්තරීතර අල්ලාහ් අබියස ඇති දෑ ඔබ දන්නෙහු නම් දිළිඳුකම හා අවශ්යතා වැඩිවීම ගැන ඔබ ප්රිය කරනු ඇත.

ෆළාලා ඉබ්නු උබෙයිද් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ජනයාට සලාතය මෙහෙයවන විට
දැඩි කුසගින්න හේතුවෙන් සලාතයේ කියාම් ඉරියව්වෙහි ඇතැම් මිනිසුන් බිම ඇඳ
වැටුණේය. -ඔවුහු පිළේ වැසියෝ වූහ. - මොවුහු කුසගින්නෙන් පෙළෙන්නෝ වෙති යැයි අරාබිවරු පවසන තරමට විය. අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- සලාතය
ඉටු කළ පසුව ඔවුන් වෙත හැරී, “උත්තරීතර අල්ලාහ් අබියස ඇති දෑ ඔබ දන්නෙහු නම්
දිළිඳුකම හා අවශ්යතා වැඩිවීම ගැන ඔබ ප්රිය කරනු ඇත.“ වැවි පැවසුහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත]

සලාතයේ කියාම් ඉරියව්වේ සිටියදී කුසගින්න හා දුර්වලකම හේතුවෙන් ඇතැම් මිනිසුන් බිම ඇද වැටුණු බව මෙම හදීසයේ සඳහන් වේ. ඔවුහු පිළේ වැසියන්ය. එමෙන්ම සහබාවරුන් අතුරින් දුප්පත්, දිළිඳු, අහිංසක පිරිසක් වූහ. ඔවුහු හැත්තෑවක් පමණ දෙනක් වූහ. ඇතැම් විට ඔවුන්ගේ සංඛ්යාව වැඩි වූ අතර තවත් විටෙක ඔවුන්ගේ සංඛ්යාව අඩු විය. ඔවුහු මස්ජිදයේ පිළේ වාසය කළහ. ඔවුනට නියමිත වාසස්ථානයක් හෝ ධනය හෝ දරුවන් හෝ නොවීය. නියත වශයෙනන්ම ඔවුන් කුසගින්නෙන් සිටින්නන් බව ගැමි අරාබි ජනයා සිතන තරමට විය. එවිට නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා උත්තරීතර අල්ලාහ් අබියස යහපත් දැයින් ඔබට ඇති දෑ ඔබ දන්නෙහු නම් ඔබගේ දිළිඳුකම හා ඔබගේ අවශ්යතා වැඩිවීම ගැන ඔබ ප්රිය කරනු ඇත යැයි පවසා සිටියහ.

https://sunnah.global/hadeeth/si/show/5825